# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
# සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 01. ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න
## බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

1. ආර්ථික පද්ධතියේ එක් එක් ඒකකය පිළිබඳවත් එහි ව්‍යුහය හා හැසිරීම පිළිබඳවත් විශ්ලේෂණය කෙරෙන විෂය ක්ෂේත්‍රය වන්නේ,
   (1) අභිමතානුරූපී ආර්ථික විද්‍යාවයි.
   (2) යථානුරූපී ආර්ථික විද්‍යාවයි.
   (3) සූක්ෂම ආර්ථික විද්‍යාවයි.
   (4) සාර්ව ආර්ථික විද්‍යාවයි.
   (5) සමාජීය ආර්ථික විද්‍යාවයි.

2. පහත ප්‍රකාශ අතුරින් අභිමතානුරූපී සාර්ව ආර්ථික විද්‍යා ප්‍රකාශයක් වනුයේ
   (1) පසුගිය වසරේ ආර්ථික වර්ධන වේගය 1.5% කි.
   (2) ආර්ථික වර්ධනය අත්කර ගැනීම සඳහා සැමට සහනාධාර ලබා දිය යුතුය.
   (3) හිඟකම සැම ආර්ථිකයකටම පොදු සංකල්පයකි.
   (4) ආර්ථික පසු බැසීමේ තත්වය මත ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය අඩු වී ඇත.
   (5) ගොවීන්ගේ ආදායම ස්ථිර කිරීමට රජය සහතික මිල ක්‍රමයක් අනුගමනය කල යුතුය.

3. පහත දෑ අතුරින් සූක්ෂම ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් වන්නේ කුමක්ද?
   (1) ගෙවුම් ශේෂය යහපත් කර ගැනීම.
   (2) පොදු මිල මට්ටමේ සිදු වන විචලනය
   (3) මූර්ත දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය
   (4) සේවා නියුක්ත මට්ටමේ උච්ඡාවචනය
   (5) ව්‍යාපාර ආයතනයක ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම

4. පහත ප්‍රකාශ අතුරින් නොමිල භාණ්ඩයක (Free Goods) ලක්ෂණයක් වන්නේ කවරක්ද?
   (1) සැපයීමේදී ආවස්ථික පිරිවැයක් ඇති නොවීම.
   (2) සමාජීය වශයෙන් හිතකර බැවින් ඒවා රජය විසින් සැපයීම.
   (3) ඉල්ලුම පූර්ණ නම්‍ය වීම.
   (4) නිෂ්පාදනය හීන වන ඵලදා නීතියට යටත් වීම.
   (5) පරිභෝජනයේදී මිලක් නොගෙවීම.


5. ශුන්‍ය මිලකදී අසීමිත සැපයුමක් ඇති සම්පත් වලට උදාහරණයක් වනුයේ ,
   (1) සාගරයේ සිටින මත්ස්‍යයන්ය.
   (2) හිරු එළියයි.
   (3) බෝතල් කළ පානීය ජලයයි.
   (4) වගා කළ භූමියයි.
   (5) ස්වභාවික වනාන්තරයයි.

6. පහත දෑ අතුරින් ආර්ථික විද්‍යාවේදී ප්‍රාග්ධන ආයෝජනයක් සේ නොසැලකෙන්නේ කවරක්ද?
   (1) භාවිතා කරන ලද මෝටර් රථයක් මිලට ගැනීම.
   (2) යන්ත්‍රෝපකරණ නිපදවීම.
   (3) වරාය ඉදි කිරීම.
   (4) මහාමාර්ග ඉදි කිරීම.
   (5) අමුද්‍රව්‍ය තොග බිහි කිරීම.

7. සම්පත් වල හිඟතාවයක් හා ඒවායේ විකල්ප භාවිත හැකියාවන් පවතී නම් ආර්ථිකයක් තුල ඒ හා සමඟම ඇති විය හැකි තත්වයක් ලෙස සැලකිය හැක්කේ,
   (1) තේරීමේ ගැටලුවක් පැන නැගීමයි.
   (2) ආර්ථිකයේ අකාර්යක්ෂමතා පැන නැගීමයි.
   (3) ස්ථාවර ආවස්ථික පිරිවැය තත්වයක් හට ගැනීමයි.
   (4) කෙසේ නිපදවිය හැකිදැයි තීරණය කිරීමයි.
   (5) වැඩෙන ආවස්ථික පිරිවැය තත්වයක් ඇති වීමයි.

8. ආර්ථිකයක් විභව නිෂ්පාදන මට්ටමට වඩා අඩුවෙන් සම්පත් උපයෝජනය කෙරේ නම් එවැනි ආර්ථිකයක නිෂ්පාදනය ප්‍රසාරණයේ ආවස්ථික පිරිවැය,
   (1) ස්ථාවරව පවතී.
   (2) ශුන්‍ය වේ.
   (3) වැඩෙන ස්වභාවයක් ගනී.
   (4) අඩුවෙන ස්වභාවයක් ගනී.
   (5) සමානුපාතිකව ඉහළ යයි.

9.




ඉහත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ නිෂ්පාදන ලක්ෂ්‍යය A සිට B දක්වා ගමන් කිරීමේදී

   (1) කිසිදු නිෂ්පාදනයක ආවස්ථික පිරිවැයක් පැන නොනගී.
   (2) නිෂ්පාදන දෙකෙහිම ආවස්ථික පිරිවැයක් හට ගනී.
   (3) X භාණ්ඩ නිෂ්පාදනය ඉහල යයි.
   (4) Y භාණ්ඩ නිෂ්පාදනය ඉහල යයි.
   (5) Y භාණ්ඩය වෙනුවෙන් x භාණ්ඩය කැප කිරීමක් සිදු කෙරේ.

10. නිෂ්පාදන සාධකයක ඵලදායිතාව ලෙස හැඳින්වෙන්නේ ,
    (1) සාධක භාවිතා කොට නිපදවා ඇති මුළු නිමැවුමයි.
    (2) නිෂ්පාදන සාධකයක සාමාන්‍ය නිමැවුමයි.
    (3) නිෂ්පාදන සාධකයක අවම නිමැවුමයි.
    (4) නිෂ්පාදන සාධකයක ආන්තික ඵලදායිතාවයි.
    (5) නිෂ්පාදන සාධකයක ආන්තික පිරිවැයයි.

11. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ඇතුලත ලක්ෂයකින් පෙන්නුම් කල හැකි නිවැරදි සංකල්ප යුගලයක් වනුයේ කුමක්ද?
    (1) ඌණ සම්පත් උපයෝජනය හා සම්පත් හිඟකම
    (2) ආර්ථික වර්ධනය හා ආර්ථික සංවර්ධනය
    (3) උපරිම කාර්යක්ෂමතාවය හා ඌණ සම්පත් උපයෝජනය
    (4) ආවස්ථික පිරිවැය හා ඌණ සම්පත් උපයෝජනය
    (5) ඌණ සම්පත් උපයෝජනය හා සේවා වියුක්තිය

12. නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනය අර්ථ දක්වනුයේ
    (1) නිෂ්පාදනයට භාවිත කරන නිෂ්පාදන ආධාරක ලෙසයි.
    (2) අවසන් පරිභෝජනයට භාවිතා කරන භාණ්ඩ හා සේවා ලෙසයි.
    (3) ඵලදායිතාවයෙන් යුත් සම්පත් ලෙසයි.
    (4) සියලුම මූර්ත වත්කම් ලෙසයි.
    (5) නිෂ්පාදන මිලට ගැනීමට භාවිතා කරන මුදල් ලෙසයි.

13. නිදහස් වෙළෙඳපොල ආර්ථික පද්ධතියක මූලික අංගයක් වනුයේ ,
    (1) රජයේ මැදිහත් වීම ඉතා ඉහළ මට්ටමක පැවතීමයි.
    (2) පෞද්ගලික දේපල හිමිකම ක්‍රමයයි.
    (3) ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා මධ්‍යගත සැලසුම් ක්‍රමය භාවිතයයි.
    (4) මිල ගණන් හා වැටුප් මට්ටම රජය විසින් තීරණය කිරීමයි.
    (5) සම්පත් පිළිබඳ පොදු හිමිකාරත්වයයි.

14. සැලසුම් ආර්ථිකයක දැකිය හැකි වැදගත් ලක්ෂණය වන්නේ
    (1) ආර්ථිකයේ තීරණ ගැනීම මධ්‍යගත වී තිබීමයි.
    (2) රජයේ ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පැවතීමයි.
    (3) ධනය හා ආදායම අසමාන ආකාරයට බෙදී යාමයි.
    (4) මිල ගණන් ආර්ථික තීරණ ගැනීමට මග පෙන්වීමයි.
    (5) ආර්ථිකය තුල දැඩි තරඟකාරිත්වයක් ඇති කිරීමයි.

15. වෙළෙඳපොල ආර්ථිකයක මිලෙහි කාර්යයන් යුගලයක් වනුයේ,
    (1) සලාක කිරීම හා ඵලදායිතාවය ඉහල නැංවීමයි.
    (2) සානුබල සැපයීම හා ඵලදායිතාවය ඉහල නැංවීමයි.
    (3) සානුබල සැපයීම හා ආර්ථික වර්ධනයක් ඇති කිරීමයි.
    (4) සංඥා සැපයීම හා ආර්ථික වර්ධනයක් ඇති කිරීමයි.
    (5) සංඥා සැපයීම හා සලාක කිරීමයි.

16. ආර්ථිකයක් තුල රජයේ ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක පවතී නම් එවැනි ආර්ථිකයක්,
    (1) විධාන ආර්ථිකයක් විය යුතුයි.
    (2) වෙළෙඳපොල ආර්ථිකයක් විය යුතුයි.
    (3) ධනවාදී ආර්ථිකයක් විය යුතුයි.
    (4) සම්ප්‍රදායික ආර්ථිකයක් විය යුතුයි.
    (5) සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් විය යුතුයි.

17. මිශ්‍ර ආර්ථිකයක් සම්බන්ධයෙන් ඔබට එකඟ විය නොහැකි ප්‍රකාශය කුමක්ද?
    (1) රාජ්‍ය හා පෞද්ගලික අංශය යන දෙඅංශයටම දේපල අයිතිය පැවතීම.
    (2) මිල ක්‍රමය මෙන්ම සැලසුම් ක්‍රමය යන යාන්ත්‍රණ දෙකෙහිම ක්‍රියාකාරිත්වය පැවතීම.
    (3) රජය ආර්ථික කටයුතු වලට කිසිසේත් මැදිහත් නොවීම.
    (4) රජය පෞද්ගලික අංශයෙන් බදු අය කිරීම.
    (5) පෞද්ගලික අංශය මිලෙන් සානුබල ලැබීම.

18. රජය පෞද්ගලික නිදහස යම්තාක් දුරකට සීමා කරමින් සමාජ සාධාරණත්වය තහවුරු වන අයුරින් ක්‍රියාත්මක වන වෙළෙඳපොල ආර්ථික ක්‍රමයක් සුවිශේෂීව අර්ථ දක්වනුයේ,
    (1) ධනවාදී ආර්ථිකයක් ලෙසයි.
    (2) සමාජවාදී ආර්ථිකයක් ලෙසයි.
    (3) මිශ්‍ර ආර්ථිකයක් ලෙසයි.
    (4) සමාජීය වෙළෙඳපොල ආර්ථිකයක් ලෙසයි.
    (5) සැලසුම්සහගත ආර්ථිකයක් ලෙසයි.

19. යම් ආර්ථිකයක් නිෂ්පාදන කාර්යක්ෂමතාවයේ පසුවන බව පෙන්නුම් කරනුයේ,
    (1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත කටයුතු කිරීමෙන්ය.
    (2) වැඩෙන ආවස්ථික පිරිවැය තත්වයකට මුහුණ දීමෙන්ය.
    (3) ස්ථාවර ආවස්ථික පිරිවැය තත්වයකට මුහුණ දීමෙන්ය.
    (4) ඌණ නිෂ්පාදනයක් වුවත් සමාජ වරණයට ගැලපෙන නිෂ්පාදනය සිදු කිරීමෙන්ය.
    (5) පූර්ණ සේවා නියුක්ති මට්ටමේ කටයුතු කිරීමෙනි.

20. ආර්ථිකයක කාර්යසාධනය ඇගයීමේ නිර්නායකයක් වනුයේ,
    (1) සම්පත් හිඟකම හා එහි විකල්ප ප්‍රයෝජනයි.
    (2) ආර්ථික කාර්යක්ෂමතාවය හා ආවස්ථික පිරිවැයයි.
    (3) බාහිර ස්ථායිතාව හා ආර්ථික වර්ධනයයි.
    (4) අභ්‍යන්තර ස්ථායිතාව හා ආවස්ථික පිරිවැයයි.
    (5) සේවා වියුක්තිය හා ආවස්ථික පිරිවැයයි.

# ආර්ථික විද්‍යාව
## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 01. ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න
### බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1. | (3) |
| 2. | (2) |
| 3. | (5) |
| 4. | (1) |
| 5. | (2) |
| 6. | (1) |
| 7. | (1) |
| 8. | (2) |
| 9. | (3) |
| 10. | (1) |
| 11. | (5) |
| 12. | (1) |
| 13. | (2) |
| 14. | (1) |
| 15. | (5) |
| 16. | (1) |
| 17. | (3) |
| 18. | (2) |
| 19. | (1) |
| 20. | (3) |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 01. ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න
## ව්‍යුහගත ප්‍රශ්න

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. (i) (a) ආර්ථික නොවන සම්පත් නිර්වචනය කරන්නේ කෙසේද?
   (b) ආර්ථික සම්පත් වර්ගීකරණය කර පෙන්වන්න.
   (ii) ව්‍යවසායකත්වය යනු කුමක්දැයි හඳුන්වා ව්‍යවසායකයාට ඉටු කිරීමට සිදු වන ප්‍රධාන කාර්යයන් කවරේදැයි සඳහන් කරන්න.
   (iii) ආර්ථික විද්‍යාවේ ප්‍රධාන සංකල්ප දෙකක් වන්නේ හිඟකම හා ආවස්ථික පිරිවැයයි.
   (a) හිඟකම හා ආවස්ථික පිරිවැය සංකල්ප පැහැදිලි කරන්න.
   (b) ආවස්ථික පිරිවැය හිඟකම නැමැති සංකල්පයට සම්බන්ධ වන්නේ කෙසේද?
   (iv) වෙළෙඳපොල ආර්ථිකයක් විධාන ආර්ථිකයකින් වෙනස් වන්නේ කවර ලක්ෂණ වලින්ද?
   (v) "නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඇති සෑම විටම ආර්ථික කාර්යක්ෂමතාවය පවතී." මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? පැහැදිලි කරන්න.

2.
   (i) ඕනෑම රටක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න කවරේද?
   (ii) (a) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක්ද?
   (b) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් නිර්මාණය කිරීමේදී භාවිතා වන උපකල්පන කවරේද?
   (iii) එක් එක් මූලික ආර්ථික ප්‍රශ්නය විසඳන ආකාරය විධාන ගත ආර්ථිකයක හා වෙළෙඳපොල ආර්ථිකයක වෙනස් වන්නේ කෙසේද?
   (iv) පහත දැක්වෙන එක් එක් සිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක නිරූපණය කර පෙන්වන්න.
   (a) ආර්ථික පසුබෑස්ම
   (b) ඉල්ලුම අඩු වීම නිසා සේවා වියුක්තිය ඉහළ යාම.
   (v) වෙළෙඳපොල ආර්ථිකයක මිලෙහි කාර්යභාරය කවරේද?

3. (i) ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ අතර වෙනස පැහැදිලි කරන්න.
   (ii) නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රමයේ ලක්ෂණ කවරේද?
   (iii) නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනයේ ස්වරූප දෙකක් වන මානව ප්‍රාග්ධනය හා ආර්ථික පොදුකාර්ය ප්‍රාග්ධනය පැහැදිලි කරන්න.
   (iv) (a) වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?
   (b) ආවස්ථික පිරිවැය ශූන්‍ය වන අවස්ථා කවරේද?
   (v) "කා සඳහා නිපදවන්නේද " යන මූලික ආර්ථික ප්‍රශ්නය විසඳීමේ දී වෙළෙඳපොල ආර්ථිකයක් විධාන ආර්ථිකයකින් වෙනස් වන්නේ කෙසේද?

4. (i) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යොදා ගනිමින් පහත සංකල්ප නිරූපණය කරන්න.
   (a) සූක්ෂම ආර්ථික විද්‍යා සංකල්ප 2ක්
   (b) සාර්ව ආර්ථික විද්‍යා සංකල්ප 2ක් නිරූපණය කර පෙන්වන්න.
   (ii) (a) ස්ථාවර ආවස්ථික පිරිවැය තත්වය පැහැදිලි කරන්න.
   (b)වැඩෙන ආවස්ථික පිරිවැය තත්වයක් තිබීමට බලපාන හේතු කවරේද?
   (iii) විධාන ආර්ථිකයක මූලික ලක්ෂණ කවරේද?
   (iv) සාමාජීය වෙළෙඳපොල ආර්ථිකය යනු කවරක්ද?
   (v) වර්තමාන ආර්ථික අවපාත තත්වය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑ හැකි අයුරු නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකින් පැහැදිලි කරන්න.
5. (i) කේන්ද්‍රීය ආර්ථික ප්‍රශ්නයට බලපාන ප්‍රධාන සාධක දෙක කවරේද?
   (ii) හිඟකම යනු කුමක්ද? එම සංකල්පය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකින් පෙන්වන්නේ කෙසේද?
   (iii) (a) ප්‍රාග්ධනය යන්න නිර්වචනය කරන්න.
   (b) ආයෝජන යන්න නිර්වචනය කර ආයෝජන මූලාශ්‍ර නම් කරන්න.
   (iv) ආර්ථික පද්ධතියක් හඳුන්වා එය ආයතනික ව්‍යුහ (මූලිකාංග) නම් කරන්න.
   (v) මිශ්‍ර ආර්ථික පද්ධතියක සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කිරීමේදී රජයේ කාර්යභාරය කවරේද?

# ආර්ථික විද්‍යාව
## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 01. ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න
### ව්‍යුහගත ප්‍රශ්න සඳහා පිළිතුරු

1.

(i) (a) නිෂ්පාදනය සඳහා යොදාගත හැකි හිඟකමක් රහිත සම්පත් ආර්ථික නොවන සම්පත්වේ.

මෙම සම්පත් ස්වභාව ධර්මයෙන් ලැබෙන අතර ආවස්ථික පිරිවැයක් නොදරා නිෂ්පාදනයට භාවිතා කල හැක.

(b)භූමිය

ශ්‍රමය

ප්‍රාග්ධනය

ව්‍යවසායකත්වය.

(ii) කිසියම් ආර්ථිකයක් තුල විසිරී පවතින නිෂ්පාදන සාධක ඒකරාශී කරමින් නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම, මෙහෙයවීම, හා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ව්‍යවසායකත්වයයි.

**ප්‍රධාන කාර්යයන්**

1. ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
2. නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම.
3. නවෝත්පාදන හඳුන්වා දීම.
4. අවදානම් දැරීම.

(iii) (a)<u>හිඟකම</u>

අසීමිත මිනිස් උවමනා සපුරා ගැනීමට සමාජය සතු සම්පත් සම්භාරය ප්‍රමාණවත් නොවීම හිඟකම වේ.

<u>ආවස්ථික පිරිවැය</u>

විකල්ප අවස්ථාවන් කීපයක් අතුරින් එක් විකල්ප අවස්ථාවක් තෝරා ගැනීම වෙනුවෙන් කැප කිරීමට සිදුවන ඊළඟ හොඳම විකල්ප අවස්ථාව ආවස්ථික පිරිවැය වේ.

(b)හිඟ සම්පත් වල විකල්ප ප්‍රයෝජන පවතින බැවින් එක් විකල්පයක් පමණක් තෝරා ගැනීමේදී අනෙකුත් විකල්ප අත්හැරීමට සිදුවේ.එසේ කැප කරන හොඳම විකල්ප අවස්ථාව අවස්ථික පිරිවැයවේ.

එම නිසා සම්පත් වල හිඟකම හා විකල්ප ප්‍රයෝජන පැවතීමෙන් තේරීමක් කිරීමක්ද , තේරීම නිසා ආවස්ථික පිරිවැයක්ද ඇතිවේ.

**(iv)**

| වෙළෙඳපොළ ආර්ථිකය | විධාන ආර්ථිකය |
|---|---|
| 1.)දේපල අයිතිය පෞද්ගලික අංශය සතුයි. | දේපල රාජ්‍ය අංශය සතුවේ. |
| 2.)මිල ක්‍රමය මඟින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳයි. | මධ්‍යගත සැලසුම් යාන්ත්‍රණය මඟින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳයි. |
| 3.)ද්‍රව්‍යාත්මක සානුබල පවතී. | බලය පදනම් කරගත් සානුබල පවතී. |
| 4.)පෞද්ගලික ව්‍යවසාය ක්‍රමයක් පවතී. | රාජ්‍ය ව්‍යවසාය ක්‍රමයක් පවතී. |
| 5.)රජයේ මැදිහත්වීම අවමවේ. | රජය ආර්ථික කටයුතු වලට දැඩිව මැදිහත්වේ. |

(v) එකඟ නොවේ.

- නිෂ්පාදන කාර්යක්ෂමතාවය යනු අවම යෙදවුමකින් උපරිම නිමවුමක් ලබා ගැනීමයි. පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය ඉටු වන තත්වයකි.

- ආර්ථික කාර්යක්ෂමතාවය යනු සමාජවරණයට ගැලපෙන ප්‍රශස්ත නිෂ්පාදන සංයෝගය උපරිමයෙන් නිපදවීමයි.

ආර්ථික කාර්යක්ෂමතාවය ඇති වීමට නිෂ්පාදන කාර්යක්ෂමතාවය මෙන්ම සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවයද පැවතිය යුතුයි.

සම්පත් බෙදා වෙන් කිරිමේ කාර්යක්ෂමතාව ඉටුවීමට නම් P=MC වීම අවශ්‍ය වේ.

2.

(i) - කුමක් කොපමණ ප්‍රමාණයකින් නිෂ්පාදනය කරන්නේද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේද?
- කා සඳහා නිෂ්පාදනය කරන්නේද?


(ii) a ) කිසියම් නිශ්චිත අවස්ථාවක දෙන ලද සම්පත් ප්‍රමාණයකින් පවත්නා තාක්ෂණය යටතේ උපරිම ඵලදායිතාවයකින් නිෂ්පාදනයේ යෙදෙන්නේ නම් රටකට භාණ්ඩ වර්ග දෙකකින් නිපදවා ගත හැකි විවිධ නිෂ්පාදන සංයෝග දැක්වෙන ලක්ෂ යා කරමින් අඳිනු ලබන රේඛාව මායිම් වක්‍රය වේ.

b) - සම්පත් සම්භාරය ස්ථාවර බව
- තාක්ෂණය නොවෙනස්ව පවතින බව
- භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිපදවන බව
- උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිතාවයෙන් භාණ්ඩ නිපදවන බව.

(iii)


| ආර්ථික ප්‍රශ්නය | වෙළෙඳපොළ ආර්ථිකය | විධාන ආර්ථිකය |
|---|---|---|
| 1.කුමක් කොපමණ ප්‍රමාණයකින් නිපදවන්නේද? | මිල හා ලාභය වැඩි භාණ්ඩ සඳහා ප්‍රමුඛත්වය ලබාදේ. | මධ්‍යගත අධිකාරියේ නියෝග වලට අනුව නිෂ්පාදනය තෝරා ගනී. |
| 2.කෙසේ නිෂ්පාදනය කෙරේද? | පිරිවැය අඩු නිෂ්පාදන ශිල්ප ක්‍රමය තෝරා ගනී. | මධ්‍යගත සැලසුම් අධිකාරියේ නියෝග වලට අනුව නිෂ්පාදන ශිල්ප ක්‍රමය තෝරා ගනී. |
| 3.කා සඳහා නිෂ්පාදනය කරන්නේද? | මිලදී ගැනීමේ හැකියාව මත නිෂ්පාදනය බෙදා හැරේ. | වැටුප් හා මිල මට්ටම් රජය විසින් පාලනය කිරීමෙන් නිෂ්පාදනය බෙදා හැරේ. |

(iv) (a)




ඉල්ලුම අඩුවී නිෂ්පාදනය අඩුවීමෙන් ආර්ථික පසුබෑස්ම ඇතිවේ. එබැවින් නිෂ්පාදන සංයෝගය මායිම ඇතුලතට ගමන් කිරීමෙන් ආර්ථික පසුබෑස්ම නිරූපණය කෙරේ.

b)




සේවා වියුක්තිය ඉහල යාමෙන් සම්පත් ඌණ උපයෝජනයක් සිදුවේ. මායිම ඇතුලතට A සිට B දක්වා නිෂ්පාදන සංයෝගය ගමන් කිරීමෙන් නිරූපණය කෙරේ.

(v) 1. තොරතුරු හා සංඥා සැපයීම.
2.සානුබල සැපයීම.
3.හිඟ සම්පත් බෙදා වෙන් කිරීම. (සලාකන කාර්යය)

3.

(i) සැපයුමෙහි හිඟකමක් දක්නට ලැබෙන භාණ්ඩ ආර්ථික භාණ්ඩවේ. ආර්ථික භාණ්ඩවල සම්පත් පිරිවැයක් හා ආවස්ථික පිරිවැයක් පවතී.

ශුන්‍ය මිලකදී අසීමිත සැපයුමක් දක්නට ලැබෙන භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ. ඒවායේ සම්පත් පිරිවැයක් හෝ ආවස්ථික පිරිවැයක් නොමැත.

(ii) 1.සජීවී සාධකයක් වේ.

2.සංචලනය කල හැකි සාධකයකි.

3.පුහුණුව හා අධ්‍යාපනය තුලින් ඵලදායීතාව වර්ධනය කල හැක.

4.සමජාතීය නොවන සාධකයකි.

5.ඉපයීමක් වශයෙන් වැටුප් හිමිවේ.

(iii) මානව ප්‍රාග්ධනය

අධ්‍යාපනය,පුහුණුව, සෞඛ්‍ය ,පලපුරුද්ද ආදිය තුලින් ශ්‍රමයේ ඵලදායිතාව ඉහල යාමයි.

උදා-: සැලසුම් ශිල්පීන් / පුහුණු ගුරුවරු

ආර්ථික පොදුකාර්ය ප්‍රාග්ධනය

භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලිය පහසු කරවන ප්‍රාග්ධන භාණ්ඩ ආර්ථික පොදුකාර්ය ප්‍රාග්ධනය වේ. මේවා ආර්ථික යටිතල පහසුකම්වේ.

උදා-: වරාය , මහා මාර්ග හා ජල සම්පාදන ක්‍රම

(iv) (a)නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත ගමන් කිරීමේදී එක් භාණ්ඩයකින් නිපදවන ප්‍රමාණය සමාන ඒකක ප්‍රමාණයකින් වැඩි කිරීමේදී, අනෙක් භාණ්ඩයෙන් කැප කරන ප්‍රමාණය හෙවත් ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් වැඩිවීමයි.

(b) - නොමිල සම්පත් භාවිතයේදී


- විකල්ප ප්‍රයෝජන නොමැති භාණ්ඩ පරිභෝජනයේදී
- සේවා වියුක්ත සම්පත් සේවානියුක්ත කිරීමට යාමේදී

(v) වෙළෙඳපොල ආර්ථිකයේදී මිලදී ගැනීමේ හැකියාව මත විසඳේ. ආදායම වැඩි මිලදී ගැනීමේ හැකියාව වැඩි අයට වැඩි නිෂ්පාදනයක් බෙදා හැරේ. සාධක වෙළෙඳපොල ක්‍රියාකාරිත්වය මත නිපදවන භාණ්ඩ භුක්ති විඳීමේ හැකියාව තීරණයවේ.


විධාන ආර්ථිකයකදී රජය විසින් වැටුප් හා මිල මට්ටම තීරණය කෙරේ. ඒ අනුව මිලදී ගැනීමේ හැකියාව ඇති අයට මෙන්ම හැකියාව අඩු අයටත් භාණ්ඩ බෙදා හැරේ.

4.

(i) (a) සූක්ෂම සංකල්ප





1) හිඟකම





2) නිෂ්පාදන කාර්යක්ෂමතාවය

(b)සාර්ව සංකල්ප




1) ආර්ථික වර්ධනය




2) ඌණ සම්පත් උපයෝජනය


(ii) (a) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත කටයුතු කරන ආර්ථිකයක එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ප්‍රමාණ වලින් වැඩි කරන විට අනෙක් භාණ්ඩයෙන් කැප කරන ප්‍රමාණය ස්ථාවරව පවතී නම් එය ස්ථාවර ආවස්ථික පිරිවැය තත්වයකි.

(b) - සම්පත් සමජාතීය නොවීම.
- තාක්ෂණය සමාන නොවීම.
- එක් නිෂ්පාදනයකට යොදන සම්පත් ඒ ආකාරයෙන්ම අනෙක් නිෂ්පාදනය සඳහා ඒ ආකාරයෙන්ම කාර්යක්ෂම නොවීම


(iii) - දේපළ හා සම්පත් රජය සතුවීම.
-මධ්‍යගත සැලසුම් අධිකාරියේ නියෝග අනුව මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම.
- රජය ආර්ථික කටයුතු වලට දැඩි ලෙස මැදිහත් වීම.
-බලය හා නියෝග මත සානුබල ලැබීම.
- පොදු යහපත හා සමාජ සුභසාධනය මත කටයුතු කිරීම.

(iv) සම්පත් අයිතිය පෞද්ගලික අංශය සතු සම්පත් භාවිතය පිළිබඳ තීරණ රජය විසින් ගනු ලබන ආර්ථික පද්ධතියකි.
වෙළෙඳපොල ආර්ථික පද්ධතියක් තුල සමාජ සාධාරණත්වය ඇති කිරීම සඳහා රජය මැදිහත් වන ආර්ථික සමාජීය වෙළෙඳපොල ආර්ථික නම්වේ.
මෙහිදී ආර්ථික, සමාජයීය,දේශපාලනමය වැනි අංශවල ඇතිවිය හැකි දුර්වලතා මග හැරීමට පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් රජය සපයයි.

(v) ආර්ථික අවපාත තත්වය කෙටිකාලීන නම් සම්පත් විනාශවීමකට ලක්වී නොමැති නම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ලක්ෂ්‍යකින් වමට විතැන්වේ.




ආර්ථික අවපාත තත්වය දිගුකාලීන නම් සම්පත් විනාශ වීමකට ලක්වී ඇත්නම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ.





2) ආර්ථික වර්ධනය

5.

(i) - සම්පත්වල හිඟකම
-සම්පත්වල විකල්ප ප්‍රයෝජන තිබීම.

(ii) අසීමිත මිනිස් උවමනා සපුරා ගැනීමට සමාජය සතු සම්පත් ප්‍රමාණවත් නොවීම හිඟකම වේ.




හිඟකම

A සංයෝගය අත්කර ගත නොහැක. ඊට හේතුව වන්නේ පවතින සම්පත් ප්‍රමාණවත් නොවීමයි.

(iii) (a) නිෂ්පාදන ක්‍රියාවලියට ආධාර කර ගන්නා මිනිසා විසින් නිෂ්පාදිත මූර්ත වත්කම් ප්‍රාග්ධනය වේ.

උදා-: කම්හල්, ගොඩනැගිලි , යන්ත්‍රෝපකරණ

(b)ආයෝජනය යනු වත්කම් සම්පාදනය කිරීමේ ක්‍රියාවලියයි.

<u>ආයෝජන මූලාශ්‍ර</u>

- විදේශ මූලාශ්‍ර
- දේශීය මූලාශ්‍ර - කුටුම්භ ඉතුරුම්
  -ව්‍යාපාරික ඉතුරුම්
  -රාජ්‍ය ඉතුරුම්

(iv) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සමාජය තුල ජීවත් මිනිසුන් විසින් නිර්මාණය කරගනු ලැබ ඇති ආයතනික වැඩපිළිවෙල ආර්ථික පද්ධතියක්වේ.

ආයතනික ව්‍යුහ

- කුටුම්භ
- ආණ්ඩුව
- ව්‍යාපාරික අංශය
- සිරිත් විරිත් සම්ප්‍රදායන්
- සානුබල
- වෙළෙඳපොලවල
- රාජ්‍ය නොවන සංවිධාන

(v)

- අනුක්‍රම බදු අය කිරීම
- අඩු ආදායම් ලාභීන්ට සහනාධාර ලබා දීම.
- ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම.
- අධ්‍යාපනය, සෞඛ්‍ය ක්ෂේත්‍රවල ආයෝජන පුළුල් කිරීම.
- දිළිඳු ජනයා භාවිතා කරන භාණ්ඩ සඳහා අඩු වක්‍ර බදු අය කිරීම.
- දේපල පිළිබඳ සීමාවන් පැනවීම.

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."